ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : PS/PCA/11/PMT/Circulars

චක්‍රලේඛ අංකය : PS/PCA/Circular/9/2025

2025 ඔක්තෝබර් මස 07 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්

**අයවැය විවාදය පිළිබඳ වැඩසටහන - 2026**

පාර්ලිමේන්තු කටයුතු කාරක සභාව විසින් අනුමත කර ඇති අයවැය කාල සටහන අනුව, 2025 නොවැම්බර් මස 07 වන දින ගරු ජනාධිපතිතුමා විසින් මුදල් අමාත්‍යවරයා වශයෙන් අයවැය කථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව දෙවන වර කියවීමේ විවාදය 2025 නොවැම්බර් මස 08 වන සෙනසුරාදා දින පෙ.ව. 9.30ට ආරම්භ කර, දෙසැම්බර් මස 05 වන සිකුරාදා දින දක්වා පැවැත්වෙනු ඇත. අයවැය දෙවන වර කියවීම පිළිබඳ ඡන්ද විමසීම 2025 නොවැම්බර් මස 14 වන සිකුරාදා දින ප.ව. 6.00ට සිදු කිරීමට නියමිතය. අයවැය කාරක සභා විවාදය 2025 නොවැම්බර් මස 15 සෙනසුරාදා දින සිට 2025 දෙසැම්බර් මස 03 වන බදාදා දින දක්වා පැවැත්වීමට නියමිත අතර, අයවැය තුන්වන වර කියවීමේ ඡන්ද විමසීම 2025 දෙසැම්බර් මස 05 වන සිකුරාදා දින ප.ව. 6.00ට පැවැත්වීමට නියමිතය. අයවැය විවාදය පිළිබඳ වැඩසටහනේ පිටපතක් ඔබගේ දැනගැනීම සඳහා මේ සමඟ අමුණා ඇත.

02. මෙම කාලය තුළ ගරු අමාත්‍යවරුන්හට විදේශ සංචාර සැලසුම් නොකල යුතු අතර, විශේෂ අවස්ථාවන් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හා තානාපති කාර්යාල හරහා අදාළ නියෝජනය ලබාදිය හැකි බව වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

03. එබැවින්, අත්‍යාවශ්‍ය කටයුතු හැර වෙනත් විදේශ සංචාරවලට මෙම කාලය තුළ සහභාගීවීමෙන් වලකින ලෙස අමාත්‍යාංශ, අමාත්‍යාංශ යටතේ පවතින ආයතන හා දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්, සභාපතිවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුම්වත් කිරීමට ද කටයුතු කරන්න.

04. තවද, අමාත්‍යාංශ සඳහා නියමිත කාරක සභා අවස්ථාවේ විවාද දිනයන්හි අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වය අත්‍යාවශ්‍ය වන අතර, සෙසු විධායක / මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ හෝ ආයතනවල රැඳීසිටීමට වගබලා ගතයුතු බව වැඩිදුරටත් දන්වමි.

ආචාර්ය එන් එස් කුමානායක
ජනාධිපති ලේකම්

දුරකථන : +94 11 2354420 ෆැක්ස් : +94 11 2446657
විද්‍යුත් තැපැල : prsec@presidentsoffice.lk

පිටපත් - 1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
3. පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්
4. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලේකම්

} කරු. දැ.ගැ.පි.

ගාලු මුවදොර, කොළඹ 01.
காலி முகத்திடல், கொழும்பு 01.
Galle Face, Colombo 01.
දුරකථන / தொலைபேசி / Telephones: +94 (0) 11 2354418, +94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: +94 (0) 11 2446657
ඊ - තැපැල / மின்னஞ்சல் / E-mail: prsec@presidentsoffice.lk

# OFFICE OF THE LEADER OF THE HOUSE OF PARLIAMENT

**Thursday, the 11th of September, 2025.**

The Committee on Parliamentary Business approved the following at its meeting held on 11.09.2025:—

## PARLIAMENTARY SITTING PROGRAMME FOR THE APPROPRIATION BILL (2026)

| | | |
|---|---|---|
| (i) | **First Reading** | 26.09.2025 (Friday) |
| (ii) | **Second Reading** ***(Budget Speech)*** | 07.11.2025 (Friday) |
| (iii) | **Debate on the Second Reading** *(Allotted Six Days)* | 08.11.2025 (Saturday)<br>10.11.2025 (Monday)<br>11.11.2025 (Tuesday)<br>12.11.2025 (Wednesday)<br>13.11.2025 (Thursday) |
| | **Division on the Second Reading** *(6.00 p.m.)* | **14.11.2025 (Friday)** |
| (iv) | **Committee of the Whole Parliament**<br>*(Allotted Seventeen Days)* | 15.11.2025 (Saturday)<br>17.11.2025 (Monday)<br>18.11.2025 (Tuesday)<br>19.11.2025 (Wednesday)<br>20.11.2025 (Thursday)<br>21.11.2025 (Friday)<br>22.11.2025 (Saturday)<br>24.11.2025 (Monday)<br>25.11.2025 (Tuesday)<br>26.11.2025 (Wednesday)<br>27.11.2025 (Thursday)<br>28.11.2025 (Friday)<br>29.11.2025 (Saturday)<br>01.12.2025 (Monday)<br>02.12.2025 (Tuesday)<br>03.12.2025 (Wednesday) |
| | **Division on the Third Reading** *(6.00 p.m.)* | **05.12.2025 (Friday)** |

**Hours of Sittings during the Second Reading and on Mondays of the Committee of the Whole Parliament**

| | |
|---|---|
| Business as per Standing Order from 22(1) to (6) | 9.30 a.m. – 10.00 a.m. |
| Questions for Oral Answers | 10.00 a.m. – 10.30 a.m. |
| Questions under Standing Order 27 (2) | 10.30 a.m. – 11.00 a.m. |
| Debating Hours | 11.00 a.m. – 6.00 p.m. |
| Motion at the Adjournment Time | 6.00 p.m. – 6.30 p.m. |

**Hours of Sittings of the rest of the days of the Committee of the Whole Parliament**

| | |
|---|---|
| Business as per Standing Order from 22(1) to (6) | 9.00 a.m. – 9.30 a.m. |
| Questions for Oral Answers | 9.30 a.m. – 10.00 a.m. |
| Questions under Standing Order 27 (2) | 10.00 a.m. – 10.30 a.m. |
| Debating Hours | 10.30 a.m. – 6.00 p.m. |
| Motion at the Adjournment Time | 6.00 p.m. – 6.30 p.m. |

***(Lunch Interval is from 12.30 p.m. to 1.00 p.m. from Mondays to Saturdays, However, Lunch Interval only on Fridays is from 12.30 p.m. to 1.30 p.m.)*** **(No Motions at the Adjournment Time on Friday, the 14th of November and on Friday, the 05th of December, 2025.)**